# ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත
## பிரதம செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்
## CHIEF SECRETARY'S OFFICE - WESTERN PROVINCE

"ශ්‍රාවස්ති මන්දිරය", 32, ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07.
"Sravasthi Mandiraya",32, Sir Marcus Fernando Mawatha, Colombo 07.
"சிராவஸ்தி" கட்டிடம்,32, ஸ்ரீமத் மார்க்கஸ் பர்ணாந்து மாவத்தை, கொழும்பு 07.

මගේ අංකය / எனது இல. / MY No. } 2/සැලසුම්/පොදු/2013

ඔබේ අංකය / உமது இல. / Your No. }

ප්‍රධාන ලේකම් / Chief Secretary | පොදු/ General

දුරකථන / தொலைபேசி / Telephone } 2698409
ෆැක්ස්/ பெக்ஸ் / Fax } 2694667

දුරකථන / தொலைபேசி / Telephone } 2691665, 2682868, 2696027, 2682869, 2682870

දිනය / திகதி / Date } 2013.12. 23


සියළුම අමාත්‍යාංශ ලේකම්වරු සහ ආයතන ප්‍රධානීන් වෙත,

ලේකම් තුමනි,

### <u>උපමාන පාදක ප්‍රදාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ වැඩසටහන - 2014</u>

මුදල් කොමිෂන් සභාව 2011.07.26 දින නිකුත් කරන ලද ~~චක්‍ර ලේඛ~~ චක්‍රලේඛ අංක FC/PSD&CBG/Circular/2011/1 පාදක කරගෙන 2014 වසර සඳහා ද උපමාන පාදක ප්‍රදාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නිර්ණායක සකස් කර ඇත.

02. ඒ අනුව 2014 වර්ෂය සඳහා මෙම නිර්නායක පදනම් කරගෙන උපමාන පාදක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ වැඩසටහන ක්‍රියාත්මක කරන ලෙස ඉල්ලා සිටින අතර, මේ සම්බන්ධව ඔබ දක්වන සහයෝගය අගය කරමි.

ජේ.එම්.සී. ජයන්ති විජේතුංග
ප්‍රධාන ලේකම්
බස්නාහිර පළාත

| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් Deputy Chief | පාලන Administration | පිරිස් හා පුහුණු Personnel & Training | මුදල Finance | සැලසුම් Planning | ඉංජිනේරු Engineering |
|---|---|---|---|---|---|

| | | | | |
|---|---|---|---|---|
| ***1.ස්වයං රැකියා ස්ථාපනය*** | | | | |
| | උපකරණ මිලදී ගැනීමට සෘජු ප්‍රදාන ලබාදිය හැකි කර්මාන්ත | අදාල වැය විෂයය | අංකය | සංකේතය |
| 1 | ගෘහ භාණ්ඩ නිශ්පාදනය | වෙනත් ආයෝජන | 2502 | N |
| 2 | විදුලි උපකරණ අළුත්වැඩියා සහ වාහන අළුත්වැඩියා | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 2103 | G |
| 3 | ඇඟළුම් කර්මාන්තය | වෙනත් ආයෝජන | 2502 | N |
| 4 | රූපලාවන්‍ය හා කොණ්ඩා සැකසුම් | | | |
| 5 | ආහාර හා කුළුබඩු නිෂ්පාදනය (ගොවිපළ නොවන) | | | |
| 6 | විසිතුරු භාණ්ඩ හා අත්කම් නිෂ්පාදන | | | |
| 7 | කොහු කර්මාන්තය | | | |
| 8 | මිරිදිය කර්මාන්තය (ඔරු හා ධීවර ආම්පන්න) | | | |
| 9 | සත්ත්ව පාලනය | | | |
| 10 | ස්වයං රැකියා අලෙවි ප්‍රවර්ධනය | | | |
| 11 | පළාතට විශේෂිත කර්මාන්ත | ව්‍යාපෘති අනුව රදා පවතී | | |
| 12 | වෘත්තීය පුහුණු | පුහුණු හා ධාරිතා සංවර්ධනය | 2401 | K |
| ***2.ආර්ථික හා යටිතල පහසුකම් සංවර්ධනය*** | | | | |
| 13 | ග්‍රාමීය මාර්ග සංවර්ධනය | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2104 | H |
| 14 | පානීය ජල සැපයුම | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2104 | H |
| 15 | විදුලිය | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2104 | H |
| ***3.සමාජ යටිතල පහසුකම් සංවර්ධනය*** | | | | |
| 16 | අධ්‍යාපනය | ගොඩනැගිලි සහ ඉදිකිරීම්/ ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 2104/ 2102 | H; F |
| 17 | පෙර පාසල් සඳහා | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ/ යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ / පුහුණු හා ධාරිතා සංවර්ධනය | 2102/ 2103/ 2401 | F, G, K |
| 18 | පාසල් සිසුන් සඳහා උපකරණ ලබා දීම | පුහුණු හා ධාරිතා සංවර්ධනය | 2401 | K |
| 19 | සෞඛ්‍යය (බටහිර හා ආයුර්වේද) | පුහුණු හා ධාරිතා සංවර්ධනය | 2401 | K |
| 20 | ග්‍රාමීය සෞඛ්‍ය සඳහා ( ව්‍යාපෘතිය මත වැය විෂයය රඳා පවතී ) | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2104 | H |
| 21 | ආබාධිත පුද්ගලයින් සඳහා ආධාර ලබා දීම | පුහුණු හා ධාරිතා සංවර්ධනය | 2401 | K |
| 22 | නිවාස | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2104 | H |
| 23 | ග්‍රාම සංවර්ධන කටයුතු | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 2102 | F |
| 24 | විදුලිය සැපයීම | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2104 | H |
| ***4.වාරිමාර්ග හා කෘෂිකර්මාන්ත සංවර්ධනය*** | | | | |
| 25 | වාරිමාර්ග | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2104 | H |
| 26 | කෘෂි කර්මාන්ත | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 2103 | G |
| ***5.ආගමික, සංස්කෘතික සහ ක්‍රීඩා සංවර්ධනය*** | | | | |
| 27 | ආගමික හා සංස්කෘතික කටයුතු | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 2104 | H |
| 28 | දහම් පාසල් සඳහා උපකරණ ලබා දීම | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 2102 | F |
| 29 | දහම් පාසල් ගුරු, සිසු හා විවිධ ක්ෂේත්‍රවල පුද්ගයින්ගේ නිපුණතා ඇගයීම | පුහුණු හා ධාරිතා සංවර්ධනය | 2401 | K |
| 30 | ආගමික හා සංස්කෘතික පැවැත්වීම | පුහුණු හා ධාරිතා සංවර්ධනය | 2401 | K |
| 31 | කලායතන සඳහා උපකරණ ලබා දීම | වෙනත් ආයෝජන | 2502 | N |
| 32 | ක්‍රීඩා උපකරණ ලබා දීම | වෙනත් ආයෝජන | 2502 | N |
| 33 | ක්‍රීඩකයින් සවිබල ගැන්වීම | පුහුණු හා ධාරිතා සංවර්ධනය | 2401 | K |

2) ක්‍රීඩා සංවර්ධන

a.) පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂගේ හෝ ප්‍රධාන ලේකම් විසින් බලය පවරනු ලැබූ නිලධාරියෙකුගේ නිර්දේශය මත ලියාපදිංචි ක්‍රීඩා සමිති සඳහා රුපියල් 100,000/=ක උපරිමයකට යටත්ව ක්‍රීඩා භාණ්ඩ හෝ කායවර්ධන භාණ්ඩ ලබාදිය හැකිය.

b.) පළාත් මට්ටමේ හෝ ජාතික මට්ටමේ ක්‍රීඩා තරඟ නියෝජනය කරන ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා අත්‍යවශ්‍ය වන ඇඟළුම් හෝ ක්‍රීඩා භාණ්ඩ ලබා ගැනීමට පළාත් ක්‍රීඩා අධ්‍යක්ෂ හෝ විෂය දැනුමැති නිලධාරියෙකුගේ නිර්දේශය මත ආධාර ලබාදිය හැකිය.

i.) ජාතික මට්ටමේ ක්‍රීඩා තරඟ නියෝජනය කරන අයෙකුට උපරිමය රුපියල් 75,000/=

ii.) ජාතික මට්ටමේ ක්‍රීඩා තරඟ නියෝජනය කරන අයෙකුට උපරිමය රුපියල් 10,000/=

iii.) පළාත් මට්ටමේ ක්‍රීඩා තරඟ නියෝජනය කරන අයෙකුට උපරිමය රුපියල් 5,000/=

c.) ලියාපදිංචි ක්‍රීඩා සමිති මගින් පවත්වනු ලබන ක්‍රීඩා උත්සව සඳහා රුපියල් 50,000/=ක උපරිමයකට යටත්ව ආධාර ලබාදිය හැකිය.

❖ *විශේෂිත අවධානය යොමුකළ යුතු කරුණු*

a.) ස්වයංරැකියා, නිවාස සඳහා ආධාර ලබන ප්‍රතිලාභීන්ගේ නාමලේඛනය අනුමැතියට ඉදිරිපත් කළ යුතු අතර ප්‍රතිලාභියාගේ සම්පූර්ණ නම, ලිපිනය හා ජාතික හැඳුනුම් පත් අංකය (පිළිගත හැකි හැඳුනුම් පත් අංකයක් ) යන තොරතුරු ලබාදිය යුතුය.

b.) ඉතා ඵලදායී පොදු ව්‍යාපෘතියක් සඳහා මන්ත්‍රීවරුන් කිහිපදෙනෙකුට වුවද එකතුවී එක් එක් මන්ත්‍රීවරයාගේ මූල්‍ය සීමාවන් තුළ ප්‍රතිපාදන යෙදවිය හැකිය.

## 5.) ආගමික, සංස්කෘතික සහ ක්‍රීඩා සංවර්ධනය

### 1) ආගමික හා සංස්කෘතික කටයුතු

අඩු පහසුකම් හා අඩු ආදායම් සහිත සිද්ධස්ථානවල අවම අවශ්‍යතා සපුරාගැනීම සඳහා පහත කාර්යයන් සම්බන්ධයෙන් ප්‍රතිපාදන වෙන් කළ හැකිය.

a.) ආගමික සිද්ධස්ථානයේ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණය කිරීම හා සංවර්ධනය, ජල පහසුකම්, වැසිකිළි පහසුකම් හා ගොඩනැගිලි වර්ණ ආලේප කටයුතු උපරිමය රුපියල් 500,000/- ප්‍රතිපාදන ලබාදිය හැකිය.

b.) ලබාදෙන ප්‍රතිපාදනවලින් 20%ක වටිනාකමක් සහිත ප්‍රමාණයකට සිද්ධස්ථානයේ දායක සභාවේ ශ්‍රම හෝ ද්‍රව්‍ය දායකත්වය ලබාදීම කළ යුතුය.

c.) විධිමත් ලෙස ලියාපදිංචි වූ ආගමික සිද්ධස්ථානයක් ලෙස අදාළ ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය ලබාගත යුතුය.

d.) අඩු පහසුකම් සහිත විධිමත් ලෙස ලියාපදිංචි වූ දහම් පාසල් සඳහා ගොඩනැඟිලි අලුත්වැඩියාව, ජල පහසුකම්, වැසිකිළි පහසුකම් හා වර්ණ ආලේප කටයුතු සඳහා ප්‍රතිපාදන සලසා දිය හැකිය. උපරිමය රු. 300,000/= කි.

e.) දහම් පාසල් කටයුතු පවත්වාගෙන යාම සඳහා අත්‍යාවශ්‍ය උපකරණ හා පරිගණක උපාංග ලබාදිය හැකි අතර එක් දහම් පාසලක් සඳහා වෙන්කළ හැකි උපරිමය රුපියල් 100,000/=කි.

f.) දහම් පාසල් සිදු දරුවන්ගේ සිසු නිපුණතා හා ගුරුවරුන් ඇගයීම සඳහා වෙන් කළ හැකි උපරිම ප්‍රතිපාදන ප්‍රමාණය රු. 150,000/- කි.

g.) ආගමික, සංස්කෘතික හා සමාජ ආචාර ධර්ම ආරක්ෂාවන සම්ප්‍රදායික උත්සව සඳහාත් පාරම්පරික නැටුම් කණ්ඩායම් හා කලා කටයුතු සංරක්ෂණය කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කළ හැකිය. උපරිමය රු. 200,000/- කි.

h.) ලියාපදිංචි කලායතනයක් සඳහා උපකරණ ලබා දීමට වෙන්කළ හැකි උපරිම ප්‍රතිපාදන ප්‍රමාණය එක් ආයතනයක් සඳහා උපරිමය රුපියල් 100,000/- කි.

i.) සංවර්ධන කාර්යයන් උදෙසා විවිධ ක්ෂේත්‍රවල සුවිශේෂී හැකියාවන් දැක්වූ පුද්ගලයින් ඇගයීම සඳහා හා මානව සම්පත සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් කළ හැකිය.

## 4.) වාරිමාර්ග හා කෘෂිකර්මාන්ත සංවර්ධනය

### i.) වාරිමාර්ග

a.) කුඩා වාරිමාර්ග ඉදිකිරීම, ඇලවේලි ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය සිදුකළ හැකිය.

b.) පොදු කෘෂි ළිං ඉදිකිරීම සඳහාද ආධාර ලබාදිය හැකිය.

c.) ප්‍රතිලාභී දායකත්වය මෙම කටයුතු සඳහා අනිවාර්ය වේ.

### ii.) කෘෂි කර්මාන්ත

a.) පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂගෙන් හෝ ප්‍රධාන ලේකම් විසින් තීරණය කරනු ලබන නිලධාරියෙකුගෙන් ලබාගනු ලබන නිර්දේශයන් පදනම් කරගෙන ලියාපදිංචි ගොවි සංවිධානවලට කෘෂි උපකරණ/ආම්පන්න ලබාදියයුතු අතර එම උපකරණ/ආම්පන්න අදාල ගොවි සංවිධානයේ තොග ලේඛනයට අනිවාර්යයෙන්ම ඇතුළත් කළයුතුය.

b.) කෘෂි උපකරණ/ආම්පන්නවල උපරිම වටිනාකම රුපියල් 100,000/= කි.

c.) ලබාදෙන භාණ්ඩ පොදුවේ ගොවීන් අතර භාවිත කළ හැකි ස්වරූපයේ උපකරණ /ආම්පන්න වියයුතුය.

සැ.යු.- මෙයට පෙර අදාල ගොවි සංවිධානයට ලබාදී ඇති උපකරණ හා ආම්පන්න පිළිබඳවත් ඒවායේ භාවිතය පිළිබඳවත් ඇගයීමක් අදාළ ක්‍රියාත්මක බලධාරියා විසින් කළයුතුය.

*iii.)* නිවාස

*A.) නිවාස සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම*

a ) බිත්ති බැඳ අවසන් කර ඇති නිවසක වහලය සඳහා අවශ්‍ය ඇස්බැස්ටස්, උළු හෝ ගේජ් 28ට නොඅඩු ලෝහ රැලි තහඩු වෙනුවෙන් එක් ප්‍රතිලාභී පවුලකට වෙන්කළ හැකි උපරිම ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් 75,000/=කි.

b ) ඉහත උපරිමය තුළ බිත්ති බැඳීමටද ආධාරය ලබාදිය හැකිය. බිත්ති බැඳීමට ආධාරය ලබා දුන්විට ප්‍රතිලාභියා විසින් සුදුසු අමුද්‍රව්‍යයක් යොදා වහළය සම්පූර්ණ කරගන්නා බවට ක්‍රියාත්මක බලධාරියා විසින් පසුවිපරම් කළයුතුය.

*B.) නිවාසවලට විදුලි සම්බන්ධතාවය ලබාදීම*

a ) පාසල් අධ්‍යාපනය ලබන දරුවන් සිටින නිවාසවලට අදාල ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය මත එක් ප්‍රතිලාභී පවුලකට රුපියල් 25,000/=ක උපරිමයකට යටත්ව විදුලි සම්බන්ධතාවය ලබාදිය හැකිය.

b ) නිවසට විදුලිය ලබා ගැනීම උදෙසා ලබාදෙන ආධාර මුදල ගෙවිය යුත්තේ විදුලි බලය සපයනු ලබන ආයතනයටයි.

සැ.යු. **ඉහත නිවාස ආධාර සඳහා හිමිකම් ඇත්තේ පහත එක් කරුණක් හෝ සපුරන පවුල්වලට පමණි.**

i ) අඩු ආදායම්ලාභියෙකු වීම

ii.) පවුලේ ආදායම උපයන්නා මියයාම හෝ පූර්ණ අකර්මන්‍යතාවයට පත්වීම නිසා අසරණභාවයට පත්ව සිටීම

iii.) ගෘහ මූලිකයා කාන්තාවක් වන අඩු ආදායම්ලාභී පවුලක් වීම.

iv.) ග්‍රාම සංවර්ධන කටයුතු

*A.) සමිති සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම*

a ) පළාත් සභාවේ ග්‍රාම සංවර්ධන විෂය භාර අමාත්‍යාංශ ලේකම්වරයා සෑහීමකට පත්වන වසර 2කට වඩා සක්‍රියව පවත්වාගෙන යන දැනට අවශ්‍යතාවයන්ට ප්‍රමාණවත් පරිදි උත්සව භාණ්ඩ හෝ උපකරණ නොමැති විධිමත් ලෙස ලියාපදිංචි වූ මරණාධාර සමිති, ග්‍රාමසංවර්ධන සමිති, සණස සමිති හා ප්‍රජා මණ්ඩල සඳහා ප්‍රතිපාදන වෙන්කළ හැකිය.

b ) ආධාර ලබන සමිතිය වසර 4ක් තුළ එවැනි ආධාරයක් ලබා නොමැති වියයුතුය.

c ) ඉහත සුදුසුකම් සපුරන සමිතියකට රුපියල් 100,000/=ක උපරිමයකට යටත්ව උත්සව භාණ්ඩ හෝ උපකරණ ලබාදිය හැකිය.

d ) එම උපකරණ පොදු සුබසාධන කටයුතු සඳහා භාවිත කළයුතු අතර අදාළ සමිතියේ තොග ලේඛනයට ඇතුළත් කළ යුතුය.

e ) භාණ්ඩ ලබාදීමේදී අදාළ ප්‍රාදේශීය ලේකම්ගේ හෝ අමාත්‍යාංශයේ ලේකම්ගේ නිර්දේශ හා සම්බන්ධීකරණය ලබාගත යුතු අතර විධිමත් පරිදි භාණ්ඩ භාරදී ලේඛනගත කිරීමක් කළ යුතුය.

*v.) විදුලිය සැපයීම*

a ) පාසල්, වෛද්‍ය සායන, ඩිස්පෙන්සරි හා ග්‍රාම සංවර්ධන ශාලා වැනි පොදු ස්ථානවලට රුපියල් 50,000/=ක උපරිමයකට යටත්ව විදුලිය ලබාදිය හැකිය. එවැනි අවස්ථාවලදී විදුලි බලය සපයනු ලබන ආයතනයට මුදල් ගෙවිය යුතුය.

සැ.යු. **-වීථි ලාම්පු සවිකිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කළ නොහැකිය.**

C.) පළාත් පාලන ආයතන / පාසල් පුස්තකාල සඳහා පොත් ලබාදිය හැකි අතර උපරිම වටිනාකම රුපියල් 50,000/=කි.

D.) *පාසල් සිසුන් සඳහා උපකරණ ලබාදීම*

a.) අධ්‍යාපනයට අතිදක්ෂ නමුත් දුගීභාවය නිසා පොත්පත් හා අධ්‍යාපනික උපකරණ මිලදී ගැනීමට අපොහොසත් සිසුන් සඳහා ප්‍රතිපාදන වෙන්කළ හැකිය.

b.) වසරකට එක් සිසුවෙකුට උපරිමය රුපියල් 5000/=කට යටත්ව පොත්පත් හා අධ්‍යාපනික උපකරණ ලබාදිය හැකිය.

c.) කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ හා අදාළ පාසලේ විදුහල්පතිගේ නිර්දේශ මත නියමිත පන්තිභාර ගුරුවරයා මගින් සුදුසුකම් ලැබූ සිසුවාට එම පරිත්‍යාගය කළ හැකි අතර ඒ සම්බන්ධයෙන් පන්තියේ හෝ පාසලේ අනෙකුත් සිසුන් දැනුවත් නොකළ යුතුය.

d.) සිසුවකු තෝරාගත්විට එම සිසුවාට වසරටම ප්‍රමාණවත් පරිදි අවශ්‍ය පොත්පත් හා උපකරණ ලබාදිය යුතුය.

e.) සිසුවෙකුට රුපියල් 5000/=කට වැඩි ආධාරයක් ලබාදීම අවශ්‍ය වනවිට ලබාදෙන පොත්පත්වලට හෝ උපකරණවලට වැයවන මුදලට ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබාගත යුතුය.

*ii.)* *සෞඛ්‍යය (බටහිර හා ආයුර්වේද)*

*A.) ග්‍රාමීය සෞඛ්‍යයට ප්‍රතිපාදන වෙන්කිරීම*

a.) ග්‍රාමීය සෞඛ්‍යය සායනවල ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම, ජල සැපයුම හා සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම සිදුකළ හැකිය.

b.) ග්‍රාමීය සෞඛ්‍යය මධ්‍යස්ථානවලට අවශ්‍ය පුටු / බංකු සැපයීම සිදු කළ හැකි අතර සපයන භාණ්ඩ අදාළ සෞඛ්‍යය මධ්‍යස්ථානයේ තොග ලේඛනයේ ඇතුළත් කළ යුතුය.

c.) මේ යටතේ මහජන සනීපාරක්ෂාවට බලපාන පොදු ළිං ඉදිකිරීම හෝ අලුත්වැඩියාව හා එම ළිංවල ගුණාත්මකභාවය වැඩි කිරීම සඳහා ආධාර ලබාදිය හැකි අතර මේ සඳහා ප්‍රතිලාභී දායකත්වය ලබාගැනීම අනිවාර්ය වේ.

*B.) ආබාධිත පුද්ගලයින්ට ආධාර ලබාදීම*

a.) දුගී බවින් පෙළෙන පවුල්වල ආබාධිත පුද්ගලයින්ට විශේෂයෙන්ම දරුවන්ට, ඔවුන්ගේ දෛනික ජීවිතය පහසුකරවන විශේෂිත උපකරණ ලබාදිය හැකි අතර වෙන්කළ හැකි උපරිම ප්‍රතිපාදන ප්‍රමාණය එක් අයකු සඳහා රුපියල් 50,000/=කි. උපකරණයක් වටිනාකම රුපියල් 50,000/= ඉක්මවන අවස්ථාවලදී ප්‍රධාන ලේකම්ගේ අනුමැතිය ලබාගැනීම අත්‍යාවශ්‍ය වේ.

b.) මෙම උපකරණ ඔවුන්ගේ ආබාධිත තත්ත්වය අඩුකරලීමට උපකාරී වන විශේෂිත උපකරණ වීම අවශ්‍ය වන අතර රජයේ පිළිගත් වෛද්‍යවරයකුගේ නිර්දේශයෙන් උපකරණ ලබාදිය යුතුය.

## 3.) සමාජ යටිතල පහසුකම් සංවර්ධනය

i.) අධ්‍යාපනය

A. රජයේ පාසල්වල පහත කාර්යයන් සඳහා පමණක් ප්‍රතිපාදන ලබාදිය හැකිය.

a) පාසල්වල ගොඩනැගිලි අළුත්වැඩියාව හා සංවර්ධන කටයුතු
b) ආරක්ෂිත වැට හා ගේට්ටු ඉදිකිරීම
c) පාසල් සනීපාරක්ෂක කටයුතු හා පානීය ජල පහසුකම් ලබාදීම
d) ක්‍රීඩා පිටි, ළමා උයන් ඉදිකිරීම හා සංවර්ධනය
e) පාසලේ අධ්‍යාපනික සංවර්ධන කටයුතු සඳහා අවශ්‍යවන ප්‍රධාන ලේකම් විසින් සැහීමකට පත්වන ද්‍රව්‍ය හෝ උපකරණ

සැ.යු. - තාප්ප බැඳීම සඳහා ප්‍රතිපාදන වෙන්කළ නොහැකිය.

B.) ලියාපදිංචි පෙර පාසල් සඳහා පහත සඳහන් උපකරණ ලබාදිය හැකි අතර උපරිම ප්‍රතිපාදන ප්‍රමාණය රුපියල් 50,000/= කි. -

<u>උපකරණ මිලදී ගැනීමට සෘජු ප්‍රදාන ලබාදිය හැකි කර්මාන්ත</u>

a) ළමා මේස හා ළමා පුටු (ලී)
b) ගුවන්විදුලි හා කැසට් රෙකෝඩර්
c) වාහන් කබඩ්
d) බර කිරීමේ උපකරණ
e) ප්ලාස්ටික් ළමා පුටු
f) ඉගෙනුම් උපකරණ කට්ටල (සනක රාමු, හැඩතල, ප්‍රහේලිකා කට්ටල යනාදිය)
g) පානීය ජලය සැපයීම සඳහා පිල්ටර්
h) ගුරුවරුන් සඳහා ඉගෙනුම් ආධාරක ලෙස යොදාගත හැකි පොත්පත්
i) දරුවාගේ ක්‍රීඩා හා සෞන්දර්ය හැකියා වර්ධනය සඳහා අවශ්‍ය උපකරණ ලබා දීම

සැ.යු.- පෙර පාසල් ප්‍රඥප්තිය යටතේ ලියාපදිංචි පෙර පාසල් සඳහා පමණක් මෙම උපකරණ ලබාදිය හැකිය.මෙම සියලු උපකරණ පෙර පාසල් තොග ලේඛනයේ ඇතුළත් කළ යුතුය.

a.) ඉහත කර්මාන්ත යටතේ ස්වයංරැකියාවක් සඳහා අවශ්‍ය උපකරණ ලබාගැනීමට සෘජු ප්‍රදානයක් ලෙස ප්‍රතිලාභියකුට ලබාදිය හැකි උපරිම මුදල රුපියල් 35000/= කි.

b.) උපකරණ සඳහා අවශ්‍ය මුදල රුපියල් 35000/=කට වැඩිවන අවස්ථාවකදී ඉතිරි මුදල ප්‍රතිලාභියා විසින් සපයාගෙන ඇති බවට තහවුරු වූ පසු එකඟ වූ උපකරණ ප්‍රතිලාභියාට ලබාදීමට ප්‍රාදේශීය ලේකම් විසින් කටයුතු කිරීම සිදුවේ

*iv.) ප්‍රතිලාභ ලබාදිය යුතු පුද්ගලයින්*

a.) වෙනත් ප්‍රතිලාභී ක්‍රමයකින් ආවරණය නොවූ හා මීට පෙර මෙවැනි ආධාරයක් ලැබී නොමැති අය

b.) මෙම ආධාර ලබා දීමේදී පහත පුද්ගලයින් කෙරෙහි ප්‍රමුඛතාවයක් දැක්විය යුතුය.

i.) අවුරුදු 18ත් 25ත් අතර සිටින තරුණ තරුණියන්
ii.) වැන්දඹුවන්
iii.) ආබාධිත පිරිස්

c.) යෝජිත ව්‍යාපෘතිය සාර්ථකව කරගෙනයාමේ හැකියාව ප්‍රතිලාභියාට ඇති බවද බලධාරියා විසින් සහතික කරගත යුතුය. ස්වයංරැකියා සඳහා සංවර්ධන බැංකු මගින් ලබාදෙන සහන ණය ලබාගැනීමට ප්‍රතිලාභීන් යොමුකිරීමට ද කටයුතු කළ යුතුය.

v.) වෘත්තීය පුහුණු

මෙ යටතේ ස්වයං රැකියාවක් ආරම්භ කිරීමට වෘත්තීය පුහුණු වැඩසටහන් සඳහාද මුදල් ප්‍රතිපාදන වෙන්කළ හැකිය. රියදුරු පුහුණු වැඩසටහන්ද මෙ යටතේ අදාල කරගත හැකිය. ප්‍රතිපාදන වෙන් කිරීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කළ යුතුය.

a. පුහුණු පාඨමාලා සඳහා ව්‍යාපෘති වාර්තාවක් සමඟ විධිමත් වූ ඇස්තමේන්තුවක්ද සකස් කළ යුතු අතර ක්‍රියාත්මක බලධාරියාගේ නිර්දේශය ඇතිව අදාල විෂය භාර අමාත්‍යාංශයෙන් අනුමත කර ගත යුතුය.
b. වැඩසටහනට අවම වශයෙන් ප්‍රතිලාභීන් 20 ක්වත් සිටීම වඩා සුදුසුය.
c. අඩු ආදායම් ලාභි පවුල් සඳහා ප්‍රමුඛතාවය දිය යුතුය.
d. පුහුණු වැඩසටහන අවම වශයෙන් පැය 60 ක් වත් ආවරණය විය යුතුය.
e. අදාල සම්පත් දායකයින් රජයේ ලියාපදිංචි ආයතනයක නියමිත පාඨමාලා සම්බන්ධ වෘත්තීය පුහුණුවක් ලබා ඇති බවට අදාල ක්‍රියාත්මක බලධාරියා විසින් සෑහීමකට පත් විය යුතුය.

## 2.) ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය

*i.) ග්‍රාමීය මාර්ග සංවර්ධනය*

a.) ගම තුළ හා ගම් අතර ප්‍රවාහන පහසුකම් සංවර්ධනය කිරීම මෙමගින් සිදුකළ හැකිය.

b.) ගමේ පොදු ස්ථාන (පාසල, ආගමික ස්ථාන, වෙළෙඳ පොළ, සෞඛ්‍ය සායන, පොදු ළිං, සොහොන් බිම් වැනි) සඳහා වන පිවිසුම් මාර්ග සංවර්ධනයට ප්‍රමුඛතාවය ලබාදිය යුතුය.

c.) මාර්ගවල පැති කාණු, පැති බැම්, බෝක්කු හා කුඩා පාලම් (තැලවිලි) ආදිය සංවර්ධනය සඳහා මන්ත්‍රී ප්‍රතිපාදන ලබාදිය හැකිය.

d.) පොදු ගමනාගමනය සඳහා අවශ්‍ය පඩිපේළි ඉදිකිරීමද කළ හැකිය.

සැ.යු.-පස් වැඩ සඳහා ප්‍රතිලාභීන්ගේ දායකත්වය හැකි උපරිමයෙන් ලබාගත යුතුය.

*ii.) පානීය ජල සැපයුම*

a.) සුදුසු විකල්ප ජල ප්‍රභවයකින් පානීය ජලය ලබාදීම මෙ යටතේ සිදුකළ හැකිය.

b.) ජල ව්‍යාපෘති සඳහා තත්ව ඇ[illegible]ා වාර්තාවක් ලබාගැනීමටද ආධාර ලබාදිය හැකිය.

c.) අනුමැතිය සඳහා ජල ව්‍යාපෘතයේ යෝග්‍යතාවය පිළිබඳව ජල සම්පාදන මණ්ඩලයේ සහතිකයක් ලබාගෙන තහවුරු කරගැනීම කළ යුතුය.

*iii.) විදුලිය*

a.) කුඩා ජල විදුලි බලාගාරයක් ඇරඹීම හෝ අරඹා ඇති ජල විදුලි බලාගාරයකින් දිගුවක් ලබාදීම හෝ කුඩා ජල විදුලි බලාගාරයකට අවශ්‍ය වැඩි දියුණු කිරීම සඳහා මෙමගින් ආධාර කළ හැකිය.

b.) විකල්ප බලශක්ති ලබාදීමද සිදුකළ හැකිය.

## උපමාන පාදක ප්‍රදානයන් යටතේ පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා ලබාදෙන ප්‍රතිපාදන වියදම් කිරීමේදී අනුගමනය කළයුතු ක්‍රියාමාර්ග

පළාත් සභා මන්ත්‍රීවරුන් සඳහා ලබාදෙන මන්ත්‍රී ප්‍රතිපාදන පහත අංශ සඳහා ලබා දීමට මුදල් කොමිෂන් සභාව උපදෙස් දී ඇත.

i) ස්වයංරැකියා ස්ථාපනය
ii) ආර්ථික යටිතල පහසුකම් සංවර්ධනය
iii) සමාජ යටිතල පහසුකම් සංවර්ධනය
iv) වාරිමාර්ග හා කෘෂි සංවර්ධනය
v) ආගමික සංස්කෘතික හා ක්‍රීඩා සංවර්ධනය

එම අංශ සඳහා පහත වැය ශීර්ෂ යටතේ ගරු මන්ත්‍රීවරයකු සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත.

| වැය ශීර්ෂය | සංකේතය | විෂයය | වෙන්කරන ලද මුදල රු. |
|---|---|---|---|
| 2102 – 15 | F | ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ | 1,009,615.00 |
| 2103 – 15 | G | යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 192,308.00 |
| 2104 – 15 | H | ගොඩනැගිලි සහ ඉදිකිරීම් | 1,057,692.00 |
| 2401 – 15 | K | පුහුණු හා ධාරිතා සංවර්ධනය | 865,385.00 |
| 2502 – 15 | N | වෙනත් ආයෝජන | 375,000.00 |
| | | එකතුව | 3,500,000.00 |

අනුමත ව්‍යාපෘති සංශෝධනය කිරීම හැකි තරම් අවම විය යුතු අතර විශේෂිත අවස්ථාවක සංශෝධන සිදු කරන්නේ නම් එම වැය ශීර්ෂය තුලම සංශෝධන කිරීම සිදු කරනු ලැබේ. එක් එක් කාර්යය සඳහා ප්‍රතිපාදන වෙන්වන වැය විෂයයන් ඇමුණුම III මගින් පහසුව පිණිස දක්වා ඇත .

### *1). ස්වයංරැකියා ස්ථාපනය*

*i.)* ස්වයංරැකියාවක් ලෙස කර්මාන්තයක් ආරම්භ කිරීමට හෝ ආරම්භ කර ඇති කර්මාන්තය වැඩිදියුණු කිරීමට අපේක්ෂිත පුද්ගලයින්ට අත්‍යාවශ්‍ය උපකරණ මිලදී ගැනීමට අවශ්‍ය මුළු මුදල් හෝ ඉන් කොටසක් ඉල්ලුම්කරුගේ පෞද්ගලික වත්කම්වලින් දැරිය නොහැකි බවට හා අවශ්‍ය මුදල බැංකු ණය යෝජනා ක්‍රමයක් මගින් ඉල්ලුම්කරුට ලබා ගැනීමට අපහසු බවට බලධාරීන් විසින් සෑහීමකට පත් වනවිට ඒ සඳහා අවශ්‍ය පහත සඳහන් උපකරණ මිලදී ගැනීම සඳහා සෘජු ප්‍රදාන ලබාදිය හැකිය.

උපකරණ මිලදී ගැනීමට සෘජු ප්‍රදාන ලබාදිය හැකි කර්මාන්ත

a) ගෘහ භාණ්ඩ නිශ්පාදනය
b) විදුලි උපකරණ අළුත්වැඩියා සහ වාහන අළුත්වැඩියා
c) ඇඟළුම් කර්මාන්තය
d) රූපලාවන්‍ය හා කොණ්ඩා සැකසුම්
e) ආහාර හා කුළුබඩු නිෂ්පාදනය (ගොවිපළ නොවන)
f) විසිතුරු භාණ්ඩ හා අත්කම් නිෂ්පාදන
g) කොහු කර්මාන්තය
h) මිරිදිය කර්මාන්තය (ඔරු හා ධීවර ආම්පන්න)
i) සත්ත්ව පාලනය
j) ස්වයං රැකියා අලෙවි ප්‍රවර්ධනය
k) පළාතට විශේෂිත කර්මාන්ත

*ii.)* ඉහත කර්මාන්තයන්ට අදාළව සෘජු ප්‍රදාන ලබාදෙන සෑම ව්‍යාපෘතියක් සඳහාම ව්‍යාපෘති වාර්තාවක් පිළියෙළ කළයුතුය. ඒ සඳහා නිර්දේශයන් පළාත් සභාවේ අදාල විෂය භාර දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් හෝ පළාත් සැලසුම් අංශයෙන් ලබාගත යුතුය. එමෙන්ම අදාල දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් සැලසුම් අංශය මගින් ප්‍රතිලාභියා විසින් ලබාගත් ආධාර ඵලදායී ලෙස පරිහරණය කර කර්මාන්තය පවත්වා ගෙන යන බවට පසුවිපරම් කරනු ඇත.

පොදු කරුණු

1. *හඳුනාගෙන ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති පහත ලක්ෂණවලින් සමන්විතවීම වැදගත් වේ.*
   - අදාල පෙදෙසේ ජනතාවට ඵලදායී පොදු ව්‍යාපෘති වීම
   - සීමිත මූල්‍ය සම්පත් තුළින් උපරිම ඵලදායීතාවයක් ලබාගත හැකිවීම
   - සාපේක්ෂව සංවර්ධනය අඩු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට වැඩි අවධානයක් යොමු කිරීම.
2. *ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘති යෝජනාව සාර්ථකව ක්‍රියාත්මක කරගැනීම සඳහා පහත කරුණු කෙරෙහි අවධානය යොමුවීම ඉතා වැදගත්ය.*
   - කළයුතු කාර්යය නිවැරදිව හඳුනා ගැනීම.
   - ව්‍යාපෘතියේ පිහිටීම නිශ්චිතව හඳුනා ගැනීම.
   - ව්‍යාපෘති අරමුණ හා එහි නාමය පැහැදිලි ලෙස සටහන් කිරීම.
   - ව්‍යාපෘතිය සඳහා ප්‍රමාණවත් මුදලක් වෙන්කිරීම.
   - ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළයුතු බලධාරියා නම්කිරීම.
   - යෝජිත ව්‍යාපෘතිය පහසුවෙන් හඳුනාගැනීම පිණිස සම්බන්ධීකාරකයකු පත්කර ඔහුගේ ලිපිනය හා දුරකථන අංකයක් ඇත්නම් සඳහන් කිරීම.
   - ඉදිරිපත් කරනු ලබන ව්‍යාපෘතියට වෙනත් මූල්‍ය ප්‍රභවයකින් මුදල් වෙන්වී නොමැති බව තහවුරු කරගැනීම.
3. *යෝජනා ඉදිරිපත් කළහැකි ආයතන*
   - තමා තේරී පත් වූ දිස්ත්‍රික්කය සඳහා පමණක් ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කළයුතුය.
   - දේපළක් පුනරුත්ථාපනය කිරීමට හෝ ඉදිකිරීම් සඳහා යෝජනා ඉදිරිපත් කිරීමේදී එම දේපළ රාජ්‍ය හෝ අර්ධ රාජ්‍ය ආයතනයකට පමණක් අයත් වියයුතුය.

     සැ.යු.- රේඛීය අමාත්‍යාංශවලට අයත් ආයතනවලට සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපාදන වෙන් කළ නොහැකිය.

     ස්වේච්ඡා සංවිධානයකට හෝ පෞද්ගලික දේපළකට අදාළ දේපළක් පුනරුත්ථාපනය හෝ ඉදිකිරීම් සඳහා යෝජනා ඉදිරිපත් කළ නොහැකිය.
4. *සමතුලිත සංවර්ධනයකට ගැළපෙන ලෙස යෝජනා ඉදිරිපත් කිරීම*
   - ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීමේදී ඔබගේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ කිහිපයකට බලපාන ලෙස ඵලදායී සංවර්ධන යෝජනා ඉදිරිපත් කිරීම වැදගත් වේ. මෙහිදී සාපේක්ෂව සංවර්ධනය අඩු හා ඌණ පෙදෙස් කෙරෙහි ඉහළ අවධානයක් යොමුකරමින් අනෙකුත් පෙදෙස් සඳහාද ඔබගේ අවධානය යොමුවනු ඇතැයි අපේක්ෂා කරමි. එමගින් ඔබගේ දිස්ත්‍රික්කයේ සෑම පෙදෙසකම සමතුලිත සංවර්ධනයක් ඇතිවීමට ඉවහල් වේ.
   - මෙම සමතුලිත සංවර්ධනය ඇතිකර ගැනීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන 2014 වර්ෂය සඳහා ලබා දී ඇති නිසා කුඩා ව්‍යාපෘති රාශියක් ඉදිරිපත් කිරීම වෙනුවට වඩාත් පුළුල් ව්‍යාපෘති ඉදිරිපත් කිරීම මගින් ඵලදායී සේවයක් ඉටුකිරීම සඳහා පියවර ගන්නා ලෙසද ඉල්ලමි. ඒ අනුව
     - i) පවත්නා වෙළඳපළ තත්ත්වයන්ට අනුව රුපියල් ලක්ෂයකට අඩුවෙන් කිසිදු ව්‍යාපෘතියක් සඳහා ප්‍රතිපාදන වෙන්නොකරන මෙන් කාරුණිකව ඉල්ලමි.
     - ii) එවැනි ව්‍යාපෘති සඳහා යෝජනා ඉදිරිපත් කිරීමේදී, <u>*එම වර්ෂයේම වැඩ අවසන් කිරීමට අවශ්‍ය මුළු ප්‍රතිපාදන ලබාදීමට හැකියාවක් නොපවතී නම් එම ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීම දක්වා අවශ්‍ය වන ප්‍රතිපාදන ඊළඟ වර්ෂයේ ලබාදීමට ඔබ ලිඛිතව එකඟ විය යුතු බවද සැලකුව මැනවි*</u>. එසේ නොමැති අවස්ථාවලදී එම ව්‍යාපෘති අනුමත නොකරනු ඇත.
   - රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය යටතේ නිෂ්පාදනය වර්ධනය කරලීමේ අරමුණු කරගත් ව්‍යාපෘති දියත් කිරීම අපේක්ෂා කරමි.
5. *ක්‍රියාත්මක බලධාරී ආයතනවල ඉල්ලීම*
   - අඩුපිඩන තත්ත්වයන් යටතේ කොළඹින් උතුරු නාගරික පෙදෙස්වලට නැවත දැනුම්දෙන තුරු ජලසම්පාදන යෝජනා ක්‍රම අනුමත නොකරන ලෙසට ජාතික ජලසම්පාදන හා ජලපවාහන මණ්ඩලය දැනුම්දී ඇත.
   - විදුලිය සැපයීම සඳහා වූ ව්‍යාපෘතිවලදී රුපියල් 70,000/= ට අඩු ව්‍යාපෘති ඉදිකිරීම සඳහා භාරගැනීම ලංකා විදුලිබල මණ්ඩලය ප්‍රතික්ෂේප කර ඇති බැවින් ඒ පිළිබඳවද ඔබගේ අවධානය යොමු කරමි. එසේම වර්තමාන වෙළඳපල තත්ත්වයන් මත ව්‍යාපෘති සඳහා අඩු මුදලක් වෙන්කිරීම ප්‍රායෝගික නොවන බැවින් රුපියල් 100,000/= ක අවම සීමාවකට යටත්ව විදුලි ව්‍යාපෘති සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමේදී කටයුතු කිරීම සුදුසු බව සිහිපත් කරමි.
6. *විශේෂිත අවධානය යොමුවිය යුතු කරුණු*
   - පුද්ගල හෝ සංවිධාන සඳහා ප්‍රතිපාදන වෙන්කිරීමට යෝජනා ඉදිරිපත් කරන අවස්ථාවලදී අදාල ප්‍රතිලාභී ලේඛනයක් ප්‍රතිලාභීන් විසින් දක්වනු ලබන දායකත්වය පිළිබඳ තහවුරුවක් සමග යෝජනා ඉදිරිපත් කිරීම අත්‍යාවශ්‍ය වන්නේය.
   - සෞඛ්‍යය සායන පැවැත්වීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් වෙන්කරනු ලබන් බැවින් ඔබගේ ප්‍රතිපාදන ඒ සඳහා වෙන් නොකළ යුතුය. වෛද්‍ය උපකරණ සහ ආරෝග්‍ය ශාලාවලට අවශ්‍ය වෙනත් අවශ්‍යතා ඉටුකිරීමට ඔබගේ ප්‍රතිපාදන වෙන්කිරීම සුදුසුය.